# දැයට දිවිදුන්

# වීර කැප්පෙටිපොළ



මහරගම සිරි වජිරඤාණ දහම් පාසලේ ප්‍රකාශනයකි

# ජාතිය වෙනුවෙන් දිවි පිදූ
# වීර කැප්පෙටිපොළ

(2548/2005 ජාතික නිදහස් දිනය නිමිත්තෙනි)

අනුශාසකවරු
අතිපූජ්‍ය අම්පිටියේ ශ්‍රී රාහුල නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍යපාද මහරගම ධම්මසිරි නායක ස්වාමීන් වහන්සේ

සම්පාදකවරු
පූජ්‍ය දෑදිගම සුමනජෝති හිමි
සිරිල් හේවාවසම්

ප්‍රකාශනය :
සිරි වජිරඤාණ දහම් පාසල
මහරගම
2548/2005

ප්‍රථම මුද්‍රණය - 1985
දෙවන මුද්‍රණය - 2005
තෙවන මුද්‍රණය - 2009

පරිඝනක පිටු සැකසුම :
රොහාන් ග්‍රැෆික්ස්
333, බොරුපන පාර,
රත්මලාන.
දුර : 2605717

# වටිනා ජාතික මෙහෙවරක්

ශ්‍රී ලංකාව සිංහල රටකි. බෞද්ධ රටකි. ගසට පොත්ත සේ සිංහලකමත් බෞද්ධකමත් දෙක ම එදා සිට එකට ම පැවතුණේ ය. පුරාණයේ පටන් ම සිංහල රජදරුවෝ මේ බව අමතක නො කළහ. සිංහලකමත් බෞද්ධකමත් රැකගන්නටත් වවන්නටත් ඔවුහු සටන් කළහ : යුද වැදුණහ. එහෙයින් සිවු හෙළය ම එක්සත් ව බොහෝ කලක් පැවැතිණි.

විදේශීය ආක්‍රමණිකයන්ගේ නොමනා නොයුතු වැඩ නිසාත් අපගේ ඇතැම් දුර්වලකම් නිසාත් නුවර යුගයේ ආරම්භය පටන් ම බෞද්ධකමටත් සිංහලකමටත් වූයේ මහත් විනාශයකි. පුරාණයේ වීර සිංහලයන් බිහි වූයේ පන්සල් අධ්‍යාපනය පදනම් කොට ගත් බෞද්ධ අධ්‍යාපනයෙනි. විදේශීය ආක්‍රමණිකයන් මේ රට අල්ලා ගත් දා සිට පන්සල් අධ්‍යාපනය ක්‍රමයෙන් විනාශ වූයේ ය. මිෂනාරි අධ්‍යාපනය ක්‍රමයෙන් පැතිරී ගියේ ය. එහි අනිටු පල විසින් පොහොය නිවාඩුව ද නැති වී පන්සල් හා සම්බන්ධය ද වැළැකී බෞද්ධකම හීන වී සිංහලයා තුළ පැවැති වීර අදහස් ද දියාරු වී ගියේ ය.

වර්තමානයේ සිංහලයන් බහුල ව ඇතත් සිංහ ළයක් ඇති, සිංහලකම් ඇති සිංහලයන් ඇත්තේ අතේ ඇඟිලි ගණනට යැයි කිව හොත් නිවැරැදි ය. ගරු නම්බු, ප්‍රශංසා ආදියට යට වීමත් නියම සිංහල අධ්‍යාපනයක් නොලැබීමත් මෙයට හේතු වූවා නිසැක යි. අද බොහෝ පාසල් ළමයින් එසේ සිංහලකම රැකගෙන වැඩ කළ උදාර සිංහල වීරයන්ගේ නම් දනිතොත් එය ද ඉතා ම අල්ප වශයෙනි. මේ ඉතා කණගාටුවට කරුණෙකි. එහෙයින් ඒ සිංහලයන්ගේ වීර නම් මෙන් ම වීරකම් ද දැන ගෙන ඒවා ආදර්ශයට ගනිමින් නැවැතත් සිංහල බෞද්ධ ප්‍රබෝධයක් ඇති කරවන්නට සුදුසු කාලයයි, දැන් එළැඹී ඇත්තේ.

සිරි වජිරඥාණ ධර්මායතනයෙහි තරුණ සීල සමාදානය මුල් වී පළ කැරෙන වීර චරිත පොත් පෙළ සිංහල වීරයන්ගේ වීරකම් වෙසෙසින් ම අපේ ළමා පරපුරට අවබෝධ කරවන්නට ආරම්භ කළ මහඟු පියවරෙකි. විශේෂයෙන් බාල තරුණ දෙපිරිසට මෙය වඩාත් ම ගැළපෙන ආකාරයට ඉදිරිපත් කිරීමෙන් ඔවුන් තුළ රට ජාතිය ආගම භාෂාව පිළිබඳ උදාර අදහස් දියුණු කරන්නට බලවත් රුකුලක් වනු ඇත.

මෙවර ඉදිරිපත් කැරෙන ''වීර කැප්පෙටිපොළ චරිතය'' වීර චරිත පොත් පෙළෙහි. සිවු වැන්නයි. කැප්පෙටිපොළ මහ අදිකාරම්තුමා සිංහලකමිනුත් බෞද්ධකමිනුත් ඉංග්‍රීසි ආණ්ඩුවටත් මුලු සිංහල ජාතියටත් දුන් ආදර්ශය සදානුස්මරණීය ය. නම්බුනාම තාන්නමාන්නවලට පිටු පා ස්වකීය ජාතිය රැකගැනීමට දේශය නිදහස් කැර ගැනීමට කළ සටන එතුමාගේ ජීවිත පූජාවෙන් කෙළවර වුවත් එතුමා ජාතියට පෙන් වූ පූර්වාදර්ශය මතු මතුත් සිංහල ජාතියේ අදීනත්වය සඳහා අභිමානවත් මං සළකුණු සපයනු ඇත. මේ කැප්පෙටිපොළ විරුවාණන්ගේ උදාර චරිතය ආදර්ශයට ගනිමින් සිංහල සමගිය හා ජාතික සමගිය ඇති කරවීමටත් සිංහල වීරකම් මෙවන් චරිතාපදාන තුළින් සිංහල දරුවන් තුළ පහළ කරවීමටත් කටයුතු කිරීම අප කාගෙත් පරම යුතුකමෙකි. ඒ සඳහා මේ මහඟු කටයුත්තට සම්මාදම් වූ සෑම දෙන ම ජාතියේ ගෞරවය හිමි විය යුත්තෝ ය.

අම්පිටියේ ශ්‍රී රාහුල
මහාස්ථවිර

2529/1985-12-10
පේරාදෙණියේ,
විශ්ව විද්‍යාලයීය බෞද්ධ ආයතනයේ දී ය.

# ජාතිය වෙනුවෙන් දිවි පිදූ ජාති හිතෛෂියා

ශතවර්ෂාධික කාලයක් ජයග්‍රාහී ජනතාවක් වශයෙන් ස්වාධීනව වැජඹුණු ජනකොටසකි, සිංහල ජනතාව. පවුල, ගම, නගරය වශයෙන් ඒකරාශීවී තමාගේ ම කෙනෙකු රජකු වශයෙන් පත් කරගෙන වැඩවසම් පාලන ක්‍රමයක් අනුව හැඩ ගැසුණු සිංහල ජනතාව 1815 මාර්තු 2 වෙනි දින ගිවිසුමක් මඟින් තම ස්වාධීනත්වය ඉංග්‍රීසීන්ට පවරා දී පරාදීන කොටසක් බවට පත්වීමක් ඉතිහාසයෙන් දක්නට ලැබේ.

නායක්කාර වංශික ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කෲරතර පාලනයෙන් මිදී පවතින තත්ත්වයට වඩා යහපත් වාතාවරණයක් ගොඩනැගීමේ මූලික චේතනාවෙන් ඉංග්‍රීසීන්ට රට භාරදීමට සිංහල රදළ නායකයන් ප්‍රමුඛ උඩරට ජනතාව තීරණය කරන්නට ඇතැයි සිතිය හැකි නමුත් රදළ නායකයන් තුළ මුල සිට ම පැවැති එකිනෙකා පරදා ඉහළ නැගීමේ පටු චේතනාව පදනම් කොටගත් අසමඟිතාව නිසා ඉංග්‍රීසීන්ට නොසිතූ පරිදි ලක්බිමේ උරුමක්කාරයන් වීමට අවස්ථාවක් උදාවිය.

සිංහල රාජ්‍යය ඉංග්‍රීසීන්ට පාවා දීමෙන් සිංහල නායකයන් බලාපොරොත්තු වූ සියල්ල දියමත ඇඳි ඉරක් මෙන් නිශ්ඵල විය. සාමාන්‍ය සිංහල ජනතාවට තමන් අතරමං වූ කොටසක් සේ දැනෙන්නට විය. තමා අතින් වූ වැරැද්ද නිවැරදි කිරීමට සිතූ ඔවුහු නිදහස් සටනක් ඇරඹූහ. එය බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වන ලද 1818 ඌවේ කැරැල්ලයි. 1817 ඔක්තෝම්බර් මාසයේ වෙල්ලස්සේ දී කිවුලේ ගෙදර, කොහුකුඹුරේ, ඇල්ලේපොළ හා ඉහගම ආදීන් මේ නිදහස් සටන මෙළැවූහ. එය මහත් සටනක් බවට පත් වූයේ වීර කැප්පෙටිපොළ නිලමෙතුමා එහි නායකත්වයට පත් වීමෙන් පසු ව ය.

කන්ද උඩරට රාජ්‍යයේ පැරණි පවුලකින් පැවත එන මෙම කැප්පෙටිපොළ නිලමේතුමාගේ මුත්තණුවන් නරේන්ද්‍රසිංහ රාජ සභාවේ බත්වඩන නිලමේ, මාතලේ, තමන්කඩුව හා සතර කෝරලේ දිසාව ආදී තනතුරු දරා ඇත. මෙතුමා මාතලේ මොනරවිල පදිංචිවී මොනරවිල පවුලට අයත් කුලකාන්තාවක් විවාහ කරගත් බැවින් ''මොනරවිල'' යන්න නමේ මුලට එකතු විය. දළදා මාලිගාවේ දියවඩන නිලමේ තනතුර දැරූ මොනරවිල කැප්පෙටිපොළ හෙවත් ''ගොලහැල නිලමේ'' මේ ජාතික සටනේ පෙරමුණ ගත් කැප්පෙටිපොළ මහ දිසාවගේ පියතුමා ය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කැප්පෙටිපොළ දිසාව මාතලේ ප්‍රදේශය භාර දිසාපති වශයෙන් පත් කෙළේ ය. මෙතුමා ජනතාව අතර වඩාත් ප්‍රසිද්ධ වූයේ මොනරවිල යනුවෙනි. ඌවේ දිසාව වශයෙන් එතුමා උඩරට ගිවිසුමේ අත්සන් තබා ඇත්තේ ද ''මොනරවිල'' යනුවෙනි.

වීර ජනනායකයකු තුළ තිබිය යුතු උදාර ගතිගුණ කැප්පෙටිපොළ චරිතයෙන් මැනවින් පැහැදිලි වේ. රටේ, ජාතියේ, ආගමේ නිදහස පතා කැරලිකාරයන්ට එකතුවූ මෙතුමා තමා සතුව සිටි ඉංග්‍රීසි හමුදාවට ''තොපගේ තුවක්කුවලින් තොපටම වෙඩි තැබීම සිංහල අපට තරම් නොවේ. මේ තුවක්කු වෙඩි බෙහෙත් හා අවි ආයුධ තොපගේ ආණ්ඩුකාරයාට භාර දී ඌවේ දිසාව කැරලිකාරයන්ට එකතු වූ බව දන්වව්'' යයි පවසා ඇත. නිර්භීත රණ ශූරයකු වූ මෙතුමා අවංක ජනනායකයෙකු බවට ද මෙය උදාහරණයකි.

සිංහල ජාතියට බුද්ධාගමට විශිෂ්ඨ අන්දමින් ගරු කළ මෙතුමා අනෙක් රදළවරුන් ද්‍රවිඩ මුසු ග්‍රන්ථ අක්ෂරයෙන් ගිවිසුමට අත්සන් කරද්දී ගලගොඩ, ගලගම නිලමවරුන් සේ පැහැදිලි සිංහලයෙන් ගිවිසුමට අත්සන් කර ඇත. එතුමාගේ

අන්තිම ඉල්ලීම වූයේ දළදා මාලිගාවට ගෙන යන ලෙස ය. කැප්පෙටිපොළ නිලමෙතුමා සිර ගෙදර සිටි කාලය තුළ යුද හමුදා ආරෝග්‍යශාලාවල නියෝජ්‍ය ඉන්ස්පෙක්ටර් ජනරාල් වශයෙන් සිටි ''හෙන්රි මාෂල්'' දිවයින සහ එහි පදිංචි කරුවන් පිළිබඳ විස්තර'' නැමැති ස්වකීය ග්‍රන්ථයෙහි සඳහන් කරන පරිදි එතුමා ඒ අවස්ථාවේ ගබඩාවේ එළිපත උඩ වැඩසිටි භික්ෂූන් වහන්සේ ඉදිරියේ දණ ගසා තමන් කළ පුණ්‍ය කර්මයන් සවිස්තරව ප්‍රකාශ කළ බවත් මින් මතු හිමාල වනයෙහි දෙවියකුව ඉපිද මෙතේ මුනි රජුන්ගෙන් දහම් අසා නිවන් ප්‍රාර්ථනා කළ බවත් සඳහන් වේ. එසේ ම අන්තිම මොහොතේ සිය ඉණෙන් කුඩා බණ පොතක් එළියට ගෙන එයින් ගාථා කීපයක් කියවා ඉක්බිති මිත්‍ර ධර්මය, කරුණාව පිළිබඳව ස්වකීය කෘතඥතාව දක්වන සලකුණක් ලෙස ''සෝයර්ස්'' මහතාට එම පොත දෙන ලෙස දන්වා සිංහල නිලධාරියකුට දුන් බව සඳහන් වේ. අධිපතිතුමා ගාථා කියවාගෙන යද්දී වධකයාගේ කඩු පහරට ලක් වූ බවත් ඒ සමගම ''අරහං'' යන වචනය එතුමාගේ මුවින් නිකුත් වූ බවත් එහි සඳහන් වේ. ඉංග්‍රීසි ජාතිකයෙකුම පවසන මෙම ප්‍රවෘත්තියෙන් පැහැදිලි වන්නේ සටනේ පෙරමුණ ගෙන වීර සෙබළකු සේ තම සතුරන් ඝාතනය කළත් අවිහිංසාව කරුණාව මෛත්‍රිය පෙරදැරි කරගත් විශිෂ්ඨ බෞද්ධයෙකු සේ එතුමා හැසිරුණ අන්දම ය. තම සටන ජාතිය ආගම රට වෙනුවෙන් කරන උදාර සේවයක්, පිංකමක් ලෙස එතුමා සලකන්නට ඇත. අනෙක් අතින් එය තමන් වෙතින් විය යුතු සේවයක් මෙන්ම තමන් සතු යුතුකමක් වශයෙන් ද සලකන්නට ඇත.

හෙන්රි මාෂල් මහතා පවසන ලෙස කැප්පෙටිපොළ නිළමෙතුමා ස්වාභාවිකව ද, ආත්ම දමනයෙන් යුක්තව ද සිරගෙයි ගත කෙළේ ය. තමාගේ කිලිටි වස්ත්‍රය දිගහරිමින් ''මා කලින්

ඇන්දේ මෙසේ නොවන බව ඔබ දන්නවා නොවැ'' යි මාෂල් මහතාට කී බවත් කැරැල්ල ගැන කථා කිරීමට මෙතුමා කිසි දිනක නොපැකිළුණු බවත් යුරෝපීයයන් සමග කුලුපගව ද හෘදයාංගමව ද ආශ්‍රය කළ බවත් පවසා ඇත.

ජාතිය වෙනුවෙන් දිවි පිදූ මේ ජාති හිතෛෂියා ගැන කරුණු දක්වන මාෂල්, එතුමා ස්කොට් ජාතික වීරයෙකු වූ හෙන්රි වොලස්ට සමාන කැර ඇත. එසේ ම එතුමාගේ හිස් කබල එඩින්බර්ග්හි මානව විද්‍යා කෞතුකාගාරයට ගෙන ගොස් මෙලෙස ම මැරුම් කෑ ස්කොට් ජාතික වීරයාගේ හිස්කබල අසලින් ම තබන ලදී.

මෙලෙස වීර චරිතයකට තිබිය යුතු ගුණාංගවලින් සැදුම් ලත් කැප්පෙටිපොළ චරිතය සිංහල අපට ආදර්ශයකි. සිංහලයන් වන අප සතුව ප්‍රෞඪ ඉතිහාසයක් ඇති බව ලෝකයාට නිර්භීතව ප්‍රකාශ කිරීමට මෙවැනි චරිත අතිශයින් මහෝපකාරී වේ. ජාතියක් වශයෙන් ආගමක් වශයෙන් පිරිහී යන අභාග්‍යමත් යුගයක ජීවත් වන අපි මෙලෙස අපේ ඉතිහාසයේ නොනැසී ජීවත්වන වීරපුත්‍රයන් පිළිබඳව පොත් පෙළෙක් මඟින් කරුණු දක්වා ළමා හා තරුණ පරපුර පුබුදුවාලීමට ගන්නා මේ තැත පිළිබඳව අතිශයින් කෘතඥ වෙමු.

ප්‍රේමා මුතුවත්ත
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
මහනුවර.
1985-12-26

# මේ ටිකත් කියවන්න

වීර චරිත පොත් පෙළේ සිව් වන පියවරට පා තබන්නට හැකිවීම අපේ බලවත් සතුටට හේතුවකි. හොඳ පොත් කියැවීමෙහි ලා ඉමහත් පිපාසයකින් සිංහල පාඨකයන් පෙළෙන බව අප මෙම ක්‍රියාදාමයෙන් ලත් මහඟු අත්දැකීමයි. ඇසැබි පොත පත නිසා අමාරුවට වැඩී සිටින අපේ දරුවන් නිසි මඟට ගැනීම සඳහා මෙවැනි පොත පත ලිවීමට දිරිදීම මහඟු පින්කමකි.

මෙම පොත් කෙටි කාල සීමාවක් තුළ කියවා නිම කරන්නට හැකිවීම ගැන බොහෝ දෙනා පැසසුම් කළ අතර මෙම පොත් තව ටිකක් විශාල කරන්නැයි ඉල්ලා සිටි අය ද වූහ. එහෙත් මීට වඩා විස්තරාත්මකව පොතක් ලිවීම මසකට වරක් කළ හැක්කක් නොවේ. මෙම පොත් පෙළින් අප නර වීරයන්ගේ ජීවිත කතාවල ඉතා වැදගත් තැන් හැකි පමණ ඔබ අතට පත් කිරීමට වෙහෙස දරන්නෙමු. අවශ්‍ය වන වැදගත් ම දෙය නම් පොත විශාල වීම හෝ කුඩා වීම හෝ නොව මේ පොත් පෙළින් විස්තර කැරෙන ගරු කටයුතු ගිහි පැවිදි උතුමන්ගේ ජීවන චරිතවලින් ගතහැකි උපරිම ආදර්ශ ගෙන තම ජීවිත වැඩදායක කර ගැනීමට වෙහෙස දැරීම ය.

මෙම උදාර කටයුත්තට අප සිත් සතන් යොමු කළ අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ අප මහානායක මාහිමිපාණන් වහන්සේට දිගාසිරි පතමු. බලවත් අවිවේකය මැද මෙම පොතට සුදුසු පෙරවදනක් සැපයීම ගැන අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුළ ස්වාමීන්ද්‍රයන් වහන්සේට නමස්කාර පූර්වක ස්තුතිය පිරිනමමු.

මෙම පොත සකස් කිරීමේ දී අප දන්නා දේට අමතර ව සිංහල මහා වංශයෙනුත් මහාචාර්ය තෙන්නකෝන්

විමලානන්ද මහතාගේ උඩරට කැරැල්ල (2 වන කොටස) ග්‍රන්ථයෙනුත් ආභාෂය ලබන්නට සිදු විය.

මෙහි යම් අඩුපාඩුවක් වෙතොත් එය අප වෙත දන්වා එවීම වැදගත් ය. මීළඟ පොතෙන් එය පෙන්වා දිය හැකි හෙයිනි.

වීර චරිත කියවන්න, වීරයන් ගිය මඟ යන්න.
වීරයෝ මළත් නොමැරෙන්නෝ ය.

පූජ්‍ය දැදිගම සුමනජෝති හිමි
සිරිල් හේවාවසම්

2529/1985-12-26

## වීර කැප්පෙටිපොළ නම

ලක් මව හඬා වැළපෙද්දී දරු පෙමට
රට දැය නමින් ගොස් නොබියව රණ බිමට
දිවි පිදූ වීරවර ''කැප්පෙටිපොළ'' නමට
හිස නොනැමුවොත් ඒ සිංහලකම කුමට?

# වීරයෝ මළත් නො මැරෙන්නෝ ය.

ලෝකයේ විවිධ වීරයෝ පහළ වෙති. ජාතිකාභිමානය, දේශාභිමානය, ආගමාලය හා භාෂා සාහිත්‍යය වෙනුවෙන් සිය දිවි කැප කළ අය පමණක් නොව නව නිපැයුම් බිහි කල අය ද වීරෝත්තමයන් ගණයෙහි ලා සැලකිය හැකි ය. ජාතික නිදහස් දිනය නිමිත්තෙන් මහරගම සිරි වජිරඤාණ දහම් පාසල මුල්ව ජාතික වීරවරයන්ට හරසර දැක්වීම වසර කිහිපයක සිට ජාතික නිදහස් දිනයේ දී සිදු කරගෙන එනු ලැබේ. මද්දුම බණ්ඩාර වීරයා මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණෝ සහ විහාරමහා දේවිය දැනට ජාතික නිදහස් දින තුනකදී නිකුත් කැර ඇති වීර අපදාන තුනකි. මෙවර එළි දක්වන්නේ ජාතිය වෙනුවෙන් දිවි පිදූ වීර කැප්පෙටිපොළ වීර අපදාන යි.

අපවත් වී වදාළ පරමපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙම වීර අපදාන පොත් පෙළ සම්බන්ධයෙන් නොයෙක් වර ප්‍රකාශ කළ වාර බොහොම යි. අපේ දරුවන් වීරවරයින් පිළිබඳ නොදන්නා බවත් වැඩිහිටියන් පවා වීරවරයින් පිළිබඳව වැඩි තොරතුරු නොදන්නා බවත් මතක් කර දුන් අතර මුදල් තියෙන පිරිස මෙම වීර අපදාන පොත් මුද්‍රණය කරවා නොමිලේ බෙදාදීම ජාතික මෙහෙවරක් බවත් ප්‍රකාශ කළා. එය ඒ ආකාරයෙන්ම කිරීම අපහසු වුවත් සහනදායී මිළකටවත් මෙම පොත ඔබ අතට පත් කරන්නට ලැබීම සතුටට කාරණයකි.

සිරි වජිරඤාණ දහම් පාසලේ සියලු කටයුතු ප්‍රධාන ප්‍රතිපත්ති පහක් යටතේ සිදු කැරෙන අතර විෂය සමගාමී ක්‍රියාකාරකම් වශයෙන් සලකා සෑම වසරකම වීරවරයින් නිදහස් දින සිහිපත් කිරීම කලක සිට සිදු කැරගෙන එන චාරිත්‍රයකි.

දෙස බස රැස හා ආගම වෙනුවෙන් මහත් මෙහෙවරක් සිදු කළ ඒ උතුමන් ගේ වීර ක්‍රියාකාරකම් ඉස්මතු වන ආකාරයෙන් මෙම සිහිපත් කිරීම සිදු කෙරේ.

මහරගම, සිරි වජිරඥාණ ධර්මායතනස්ථ සාසන සේවක සමිතියේ ග්‍රන්ථ ප්‍රකාශන පොත්හල් කමිටුව නැවතත් මෙම වීර අපදානය (2009) මුද්‍රණය කැරවීමට පියවර ගැනීම ජාතික වශයෙන් ඉතා වැදගත් කටයුත්තකි.

මෙම වීරාපදානයේ ප්‍රථම මුද්‍රණය 1985 වර්ෂයේ සිදු වූ අතර, දෙවන මුද්‍රණය 2005 වර්ෂයේ අප දහම් පාසල මුල්ව සිදු කළ අතර, තෙවන මුද්‍රණය 2009 වසරේ මේ වැදගත් අවස්ථාවේ සිදු කරන්නට ලැබීම මහත් සතුටකි. මෙම සත් කාර්යයේදී නන් අයුරින් අත හිත දුන් හැමට තෙරුවන් සරණින් දිගාසිරි සැළැසේවා යි ආශිංසනය කරමි.

හක්මන සුමනසිරි හිමි
ප්‍රධානාචාර්ය
සිරි වජිරඥාණ දහම් පාසල
මහරගම.
2552/2009-01-01

# කැප්පෙටිපොළ අදිකාරම්තුමා

ජාතිය නමින් දිවි පිදූ වීරවරයන් අතර මුල් තැනක් ගන්නා කෙනෙකි. කැප්පෙටිපොළ අදිකාරම්තුමා. වීරෝදාර තෙදවත් පෙනුමකින් යුත් ආරෝහපරිණාහ ශරීරයකින් හෙබි කැප්පෙටිපොළ අදිකාරම්තුමාගේ පියා, ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයේ දන්ත ධාතූන් වහන්සේ ගේ දියවඩන නිලමේ තනතුර හෙබැවූ ගොලහැල නිලමේ ය. මව උඩුගොඩ නම් ග්‍රාමයෙහි උපන් මොනරවිල නමැති කුල කාන්තාව ය. පවුලේ පළමුවැනියා වූ කැප්පෙටිපොළ අදිකාරම්තුමාට බාල සහෝදරියක් සහ සහෝදරයෙක් ද සිටියහ. මුළු සිංහල වර්ගයාම සෝ සයුරේ ගිල්වමින් අවාසනාවන්ත ලෙස දරුවන් සිවුදෙනා ද සමඟ බෝගම්බර පිටියේ දී ජීවිතක්ෂයට පත් වූ ඇහැලේපොළ කුමාරිහාමි මෙතුමාගේ දයාබර නැගණිය වූවා ය. නාරි ලාලිත්‍යයෙන් පරිපූර්ණ දෙල්වල එතනහාමි මෙතුමාගේ භාර්යා තනතුර දැරීමට තරම් වාසනාව ලැබුවා ය. මෙතුමා වැඩි වශයෙන් ප්‍රසිද්ධ ව සිටියේ ''මොනරවිල'' නමිනි. මොනරවිල යනු මව් පරපුරෙන් ලත් නාමයෙකි. මෙතුමාගේ සම්පූර්ණ පාරම්පරික නාමය ලෙස හැඳින්වෙන්නේ ''කැප්පෙටිපොළ රාජපක්ෂ වික්‍රමසේකර බණ්ඩාරනායක'' ය.

## කන්ද උඩරට රාජ්‍යය

ක්‍රි.ව. 1796 දී කන්ද උඩරට රාජ්‍යය හැර මුහුදුබඩ ප්‍රදේශ සියල්ලම පාහේ පැවැතියේ ඉංග්‍රීසීන්ගේ අණසක යටතේ ය. කන්ද උඩරට රාජ්‍යය කෙළේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය. එතුමාගේ ක්‍රෑරතර පාලනය නො ඉවැසූ සිංහල රදළවරු එතුමා කෙරෙහි දැඩි ලෙස කලකිරී සිටියේ ය. ඇහැලේපොළ


අදිකාරම්තුමා, මඩුගල්ල අදිකාරම්තුමා සහ මොල්ලිගොඩ අදිකාරම්තුමා ආදීන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට එරෙහි ව කටයුතු කිරීමේ ප්‍රතිඵලය වුයේ කන්ද උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පාවාදීම ය. වසර 2350 ක් පුරා උඩරට ජනතාව විඳින ලද නිදහසේ අවසන් පිටුව පෙරළමින් 1815 මාර්තු 2 වන දා කන්ද උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පවරා දීමේ ඛේදවාචකය සිදු විය.

කන්ද උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන් විසින් බලෙන් පැහැර ගන්නා ලද්දෙකැ යි කිව නොහැකිය. රාජසිංහ රජතුමා කෙරෙහි කලකිරුණු යට කී ප්‍රධානීන් ඇතුළු සිංහල පිරිස් විසින් කන්ද උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පවරා දෙන ලදී. ශ්‍රී වික්‍රම රාජසිංහ නමැති වඩුග රජුගෙන් කන්ද උඩරට රාජ්‍යය බේරා ගැනීම සඳහා ඉංග්‍රීසීන්ට පවරා දෙන ලද නමුත් ඇහැලේපොළ අදිකාරම්තුමා ප්‍රමුඛ සිංහලයන්ගේ අධිෂ්ඨානය වූයේ කෙසේ හෝ ශ්‍රී ලංකාව ඉංග්‍රීසීන්ගෙන් ආපසු ලබා ගැනීම ය.

## 1815 උඩරට ගිවිසුම

කන්ද උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පවරා දෙන ලද්දේ 11 දෙනෙකු විසින් අත්සන් කරන ලද කොන්දේසි 12 කින් සමන්විත ගිවිසුමක් මතය. එයට ''1815 උඩරට ගිවිසුම'' යයි කියනු ලැබේ. එක් පසෙකට කැප්පෙටිපොළ අදිකාරම්තුමා ඇතුළු අදිකාරම්වරු 11 දෙනෙකුත් අනෙක් පසට එංගලන්තයේ මහරජුගේ නියෝජිතයා වශයෙන් එවකට ලංකාවේ ආණ්ඩුකාර ධූරය දැරූ සර් රොබට් බ්‍රවුන්රිග්තුමාත් මෙම උඩරට ගිවිසුමට අත්සන් කළහ.

# 1815 උඩරට ගිවිසුමට මෙසේ අත්සන් තැබිණි


God save the King

Robt Brownrigg

Eheylepola

Molligoda
1st Adikar & Disave of the 7 Korles

Pilama Talawawe
2d Adikar & Disave of Saffragam

Pilama Talawuwe
Disave of the 4 Korles

Monarawila
Disave of Uva

Ratwatte
Disave of Matale

Molligoda
Disave of the 4 Korles

Dullewe
Disave of Walapane

Millawa
Disave of Wellasse & Bintenne

Galagama
Disave of Tamankada

Galagoda
Disave of Nuwara Kalawiya

## අත්සන සිංහලෙන්

මෙම උඩරට ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ දී සිදු වූ විශේෂ සිද්ධියක් මෙහි ලා සඳහන් කිරීම වටී. මෙම ගිවිසුමට ලංකාව වෙනුවෙන් අත්සන් කළ සිංහල අදිකාරම්වරු 11 දෙනාගෙන් 8 දෙනෙකු අත්සන් තැබුවේ ග්‍රන්ථ (මිශ්‍ර භාෂාවකි) භාෂාවෙනි. සිය මව්බස වූ සිංහලෙන් අත්සන් කෙළේ 3 දෙනෙකු පමණි. එනම් කැප්පෙටිපොළ අදිකාරම්තුමා (මොනරවිල) ගලගම අදිකාරම්තුමා සහ ගලගොඩ අදිකාරම්තුමා ය. වර්තමානයේ පවතින සමාජ රටාව අනුව බොහෝ දෙනා ඉංග්‍රීසියෙන් කථා කරන්නටත් ලියන්නටත් අත්සන් තබන්නටත් කැමැත්තා සේ එවකට පැවැති ශ්‍රී වික්‍රම රාජසිංහ නමැති වඩුග රජුගේ පාලනය යටතේ භාවිතා වූයේ ද්‍රවිඩ මිශ්‍ර ග්‍රන්ථ භාෂාව හෙයින් එසේ කළා විය හැකිය. ඒ හැර එකල ඉංග්‍රීසීන් සිංහලයනට එරෙහි ව කටයුතු කරන නිසා බොහෝ දෙනා සිංහලයෙන් කටයුතු කරන්නට මැළිකමක් දක්වූවා විය හැකිය. එහෙත් සිංහලකම නිර්භීත ව ප්‍රකාශ කිරීමට එය සුදුසු අවස්ථාවක් කැර ගත් කැප්පෙටිපොළ අදිකාරම්තුමා ''මොනරවිල'' කියා ඉංග්‍රීසීන් ඉදිරියේ ම සිය අත්සන සිංහලෙන් යෙදී ය.

මෙම ගිවිසුමේ ඇතුළත් කොන්දේසි 12 ට අනුකූලව ඉංග්‍රීසීන් විසින් රටේ පාලන තන්ත්‍රය ගෙන යා යුතු ව තිබිණි. එහෙත් ඉංග්‍රීසීහු එම කොන්දේසි එකින් එක අතපසු කරමින් බෞද්ධයාටත් සිංහලයාටත් භික්ෂූන් වහන්සේලාටත් නානාවිධ හිරිහැර කරදර කරන්නට වූහ.

මෙම ගිවිසුමේ 5 වන වගන්තියෙහි ''මෙකී රටවල් වල මුලාදෑනීන් සහ වැසියන් විසිනුත් අදහන්නා වූ බුද්ධ ශාසනය ද දේවාගම ද කඩ කළ නොහැකිව පවත්වන්ඩ ඕනෑවා සහ එකී

කටයුතු ද සංඝයා ද විහාරස්ථාන ද දේවාල ද පවත්වන්ඩ සහ ආරක්ෂා කරන්ඩත් ඕනෑ යැ'' යනුවෙන් සඳහන් විණි. එහෙත් එම වගන්තිය කෙරෙහි ඉංග්‍රීසිහු කිසිත් සැලකිල්ලක් නොදැක්වූහ. පුරා වසර 2350 ක් ස්වාධීන ව සිටි උඩරට වීරෝදාර සිංහල ජනතාව මෙයින් බලවත් සේ කුපිත ව ඉංග්‍රීසීන්ට එරෙහි ව නැඟී සිටියහ. සිංහල ජනතාව මෙසේ කුපිතව සිටියදී ඔවුන් තවතවත් කුපිත කිරීමේ කපටි චේතනාවෙන් යුකත් ව ඉංග්‍රීසීහු කටයුතු කළහ.

.

## හජ්ජිට මුහම්දිරම් කමක්

එතෙක් සම්ප්‍රදායයක් වශයෙන් ''මුහන්දිරම්'' තනතුරු ලැබෙමින් තිබුණේ සිංහල ජනතාවට පමණි. එහෙත් මේ අවධියේ ''හජ්ජි'' නමැති මුස්ලිම් ජාතිකයාට ඉංග්‍රීසීන් විසින් මුහන්දිරම් තනතුරක් ප්‍රදානය කරන ලදී. එහි යටි අදහස වූයේ සිංහලයන් තව දුරටත් කුපිත කැරවීම ය.

ඉංග්‍රීසීන් කෙරෙහි කැප්පෙටිපොළ අදිකාරම්තුමා දැක් වු බලවත් පිළිකුල යම් යම් අවස්ථාවල එළිපිට ම ප්‍රකාශ කළ හෙයින් එතුමා පිළිබඳව ඉංග්‍රීසීන් තුළ සැකයක් ද ගොඩ නැඟෙමින් තිබිණි. මාතලේ දිසාව ලෙස එතුමා පත් කැර යැවුයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසිනි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා අත් අඩංගුවට ගත් පසුත් මාතලේ දිසාව වශයෙන් කටයුතු කරන ලෙස ඉංග්‍රීසීන් විසින් එතුමාට ම පවරන ලදී. කැප්පෙටිපොළ අදිකාරම්තුමා වැනි කෙනෙකු හොඳින් තබා නොගත හොත් කවදා හෝ තමන්ට අවහිරයක් කරදරයක් වේ යැයි සිතු ඉංග්‍රීසීන් එසේ කළා විය හැකි ය. කැප්පෙටිපොළ අදිකාරම්තුමා කෙරෙහි සැක පහළ වූවත් ඉංග්‍රීසීන් එතුමාට විරුද්ධ ව ප්‍රසිද්ධියේ නැඟ නොසිටියේ තමන්ට ඉන් සිදුවන බලවත් අයහපත ගැන කල්පනා කළ හෙයිනි. ඔවුන් නිරතුරු කල්පනා කෙළේ එතුමා තමන්ට හිතවත් ව තබා ගැනීමට ය.

## ඌවේ කැරැල්ල

මුස්ලිම් ජාතිකයෙකුට මුහන්දිරම්කමක් ප්‍රදානය කිරීම 1817 ඔක්තෝම්බර් මාසයේ කන්ද උඩරට ඌවේ කැරැල්ල පැන නඟින්නට ක්ෂණික හේතුවක් විය. කුරුණෑගල විල්බාවේ පන්සලේ නායක හාමුදුරුවන් මෙම කැරැල්ලේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළ බව පෙනේ. පසු ව උන් වහන්සේ සිවුරු හැර ඌවේ කැරැල්ලේ පෙරමුණ ගත් බව පැවසේ. මෙම කැරැල්ල මෙහෙයැ වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලා අට නමක් වූ බව පොතපතෙහි සඳහන් ය.

## විල්බාවේ හිමි දොරේසාමි වූ වග

විල්බාවේ තෙරුන් වහන්සේ මෙම කැරැල්ලේ කැපී පෙනන චරිතයක් බවට පත් වූහ. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ඥාති සොහොයුරකු ගේ පුතකු වශයෙන් හඳුන්වාගත් එතුමා ප්‍රකට ව සිටියේ ''දොරේසාමි'' නමිනි. රාජසිංහ පරම්පරාවෙන් පැවත එන නිසා තමාට රජකම් කිරීමට උරුමකම් ඇති බව දොරේසාමි විසින් නිතර පවසන ලදී.

දොරේසාමිට නොබෝ කලකින් ම සිංහල ජනතාවගේ ප්‍රියමනාප බව දිනාගත හැකි විය. හේ, තමා තුන් සිහංලයටම රජු යයි ප්‍රකාශ කැර ගනිමින් රටේ තැනින් තැන ගොස් සටන් ඇරඹීය. මේ වකවානුවේ බදුල්ල උප ඒජන්ත වශයෙන් කටයුතු කෙළේ. ඉංග්‍රීසි ජාතිකයෙකු වූ සිල්වෙස්ටර් විල්සන් මහතා ය. තුන් හෙළයේ ම රජු බව ප්‍රකාශ කැර ගනිමින් මහත් කලබැගෑනියක් කරන දොරේසාමි නැමැත්තා මෙල්ල කැරගෙන ඒම සඳහා විල්සන් මහතා විසින් ඌවට යවන ලද්දේ හජ්ජි නමැති මුස්ලිම් ජාතික මුහන්දිරම් තැන ය. මෙම ගමනේ දී

සිංහලයන් විසින් හජ්ජි පරලොව යවන ලද අතර, ඔහු සමඟ පැමිණි හේවායෝ ද විනාශ කර දමනු ලැබූහ. මේ පිළිබඳ ආරංචියෙන් බලවත් කෝපයට පත් විල්සන් උප ඒජන්තතුමා 1817 ඔක්තෝම්බර් 14 වන දින ලෙෆ්ටිනන්ට් නිව්මන් මහතාගේ මූලිකත්වයෙන් ජා හට පිරිසක් සමඟ වෙල්ලස්ස බලා පිටත් විය.

සිංහලයන්ට හිමි තැන් අහිමි කරන නිසාත් බුදු දහම විනාශ කරන නිසාත් බෞද්ධ භික්ෂූන් වහන්සේට හිංසා-පීඩා කරන නිසාත් දන්ත ධාතූන් වහන්සේට නිසි පුද සත්කාර කරන්නට ඉඩ නොදෙන නිසාත් ඉංග්‍රීසීන්ට විරුද්ධ වී සිටි සිංහල ජනතාවගේ කෝපාග්නිය කොතෙක්දැයි අවබෝධ කැර ගත් විල්සන් මහතා තුළ ඉමහත් බියක් ඇති විය. ඔහු සිංහලයන් සමඟ සාම කතා බහ ගොඩනැඟීමට කොතෙක් උත්සාහ කළත් එය අසාර්ථක විය. එහෙයින් ඔහු ආපසු බදුල්ල බලා ඒමට පිටත් විය. අතරමඟදී දිය පිපාසයක් ඇති වී මහ මඟ අයිනේ තිබූ දිය කඩිත්තකින් දිය දෝතක් ගෙන බීමට තැත් කරද්දී, සිංහලයකු විසින් විදින ලද හී පහරකට ගොදුරු වී හේ මරු මුවට පත් විය. ඔහු සමඟ ගිය විශාල පිරිසක් ද මරු තුරුලට වන්හ. මෙම සිද්ධියෙන් බලවත් සේ කුපිත වූ බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා රාජපාක්ෂික සිංහලයනට උසස් තනතුරු දෙමින් ඌවේ කැරැල්ල මර්දනය කිරීම සඳහා තවත් හේවාපන්න සමඟ ඌවට යැවී ය. තමන්ට ලැබෙන තාන්න මාන්න ලාභ සත්කාර හා උසස් තනතුරු තකා ගෙන ජාතියට එරෙහිව එසේ කටයුතු කළ සිංහලයින් කුමන යුගයකින් වුවත් සොයා ගත හැකි ය. ජාත්‍යාලයෙන් ඔද වැඩී සටන් බිමට අවතීර්ණව සිටි සිංහල සේනා අතින් ඒ හැම දෙනම මරුතුරුලට වන්හ. කෙමෙන් සටන බුර බුරා නඟින ගින්නක් මෙන් ඇවිලී යද්දී ඉන්පසු කෙළේ මේජර් මැක්ඩොනල්ඩ් සෙන්පතියාගේ ප්‍රධානත්වයෙන්

විශාල සෙබළ හමුදාවක් උඌව බලා පිටත් කැර යැවීම ය. මැක්ඩොනල්ඩ් සටන් මෙහෙයැවීමෙහි දක්ෂයකු වුවත් ඒ දිනවල පැවැති ධාරානිපාත වැස්සත් ගංවතුරත් නිසා ඔහුගේ බලාපොරොත්තු ඉටුකැර ගැනීමට නොහැකි විය. සිංහල යුද්ධ හමුදාව උඌවේ සිට සාර්ථක අන්දමින් සටන මෙහෙය වීය. ඉංග්‍රීසි හමුදාවෝ, පරාජයට පත්වීමේ වේදනාවෙන් පීඩිත ව, තමන්ට හමුවන සිංහල ගෙවල්, වතුපිටි, හරකා බාන ආදිය පවා විනාශ කැර දමන්නට වූහ. සිංහල ස්ත්‍රීන් සහ කුඩා දරුවන් පවා මරා දැමූහ. ඉංග්‍රීසීන්ගේ මේ අමානුෂික ක්‍රියා නිසා සිංහලයන්ගේ වේගය තව තවත් වැඩිවන්නට වූයෙන්, දිවි පරදුවට තබා ඔවුහු සටන් කළහ.

මේ දක්වා ම කැප්පෙටිපොළ අදිකාරම්තුමා කටයුතු කෙළේ මාතලේ මහ දිසාව වශයෙනි. සිංහල හමුදාවල සටන් මෙහෙයැ වූ අය අතර දොරේසාමිතුමා, කොහුකුඹුරේ රටේ රාළ සහ කිවුලේගෙදර මොහොට්ටාල ආදීහු ද වූහ. කැප්පෙටිපොළ අදිකාරම්තුමා පිළිබඳ ව කොතෙක් සැක පහළ වුවත් එම පිරිස මෙල්ල කිරීමට සමත් එක ම පුද්ගලයා කැප්පෙටිපොළ අදිකාරම්තුමා බව ඉංග්‍රීසීන්ගේ පිළිගැනීම විය. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමා, කැප්පෙටිපොළ අදිකාරම්තුමා නුවරට කැඳවා උඌවේ කැරැල්ල මර්දනය කිරීමේ මහා සටනින් ජය ගන්නේ කෙසේ දැයි විමැසී ය. තමා දරමින් සිටි තනතුර අලුයම ලූ කෙළ පිඬක් සේ සලකා ඉන් අත්මිදී කෙසේ හෝ සිංහල දේශප්‍රේමීන් සමඟ එකතු වීමට සුදුසු ඉඩක් බලමින් සිටි එතුමාට මෙම සිද්ධිය බලවත් සතුට ගෙන දෙන්නක් විය. එකල උඌවේ දිසාව වී සිටි මැල්ලෑව වයස්ගත නිසා කැරැල්ල මර්දනය කරන්නට තරම් ශක්තියක් නැති බවත් තමා සේනාවත් සමඟ එහි පිටත් කැර යන්නේ නම් කැරැල්ල එකපයින් ම සන්සිඳුවන්නට හැකි බවත් එතුමා ආණ්ඩුකාරවරයාට සැළකැර

සිටියේ ය. ආණ්ඩුකාරවරයා කැප්පෙටිපොළ අදිකාරම්තුමාගේ උගුලෙහි අසුවිය. ශ්වේත වර්ණ තරුණ අසකු පිට නැඟුණු රණකාමී කැප්පෙටිපොළ අදිකාරම්තුමා ඉතා ගාම්භීර අන්දමින් සිය සේනාවත් සමඟ ඌවට සැපත් විය.

## සුහද හමුවක්

එම අවස්ථාවේ එකී ප්‍රදේශයේ පෙරමුණ ගෙන සිටියේ කොහුකුඹුරේ රටේ රාළ ය. කැප්පෙටිපොළ අදිකාරම්තුමාත් කොහුකුඹුරේ රටේ රාළත් ඉතා හොඳ මිත්‍රයෝ වූහ. එම නිසා අදිකාරම්තුමා එන පෙරමඟට යන්නට කිසිදු බියක් වකිතයක් ඇති නොවී ය. ඔහු පෙරමඟට ගොස් සුදු අසුපිට නැඟී වීරෝදාර ලීලාවෙන් තමා අබිමුවට එන අදිකාරම්තුමා අමතා මෙසේ කීයඃ

''සහෝදරයා, අපි මේ සටන් කරන්නේ ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ට විරුද්ධවයි. අපේ රටේත් ජාතියේත් ස්වාධීනත්වය පතායි. ඔබේ සහාය අපට වුවමනා කරන මේ මොහොතේ ඔබ මේ හදන්නේ කුමක් කරන්න ද?''

කැප්පෙටිපොළ අදිකාරම්තුමාගේ මුව'ගට සිනා පහළ විය. එතුමා මෙසේ පිළිවදන් දිනි ඃ

''ප්‍රිය සහෝදරය, ඔබට අනුන්ගේ සිත් දැන ගැනීමේ නුවණ පහළ වූයේ කවර දා ද? මම කවරදාවත් මගේ ජාතියට මගේ රටට මගේ ආගමට විරුද්ධව කටයුතු කරන්නෙක් නොවෙමි. මම කවරදාවත් සුද්දන්ගෙන් ලැබෙන තාන්නමාන්නවලට වත් නිලතලවලටවත් යටවන මිනිහෙක් නොවෙමි. මාත් ඇඟිලි ගනිමින් සිටියේ ඔබ හැමට එකතුවන්නට

සුදුසු මොහොත එළැඹෙන තුරුයි. දැන් ඒ මොහොත ඇවිත් තිබෙන බව පෙනෙනවා. අපි එක්වී සමඟියෙන් ඉදිරියට යමු.''

කොහුකුඹුරේ රටේ රාළට අප වීරයා පෙනුණේ සුරපුරින් බට සුර දූතයකු ලෙසිනි. ඔහු පසුපසින් පැමිණි සිංහල සේනාවගේ මුවින් එවිට ම ''කැප්පෙටිපොළ වීරයාට ජයවේවා'' යි ඔල්වර හඬ පැතිරිණි. කැප්පෙටිපොළ අදිකාරම්තුමා සමඟ පැමිණි ඉංග්‍රීසි සේනාවෝ සිදුවන්නට යන්නේ කුමක්දැයි අදහාගත නොහී විමතියට පත් ව ගල් ගැසී බලා සිටියහ.

සිය රිදීවන් කඩුව කොපුවෙන් ඇදගත් අප වීරයා ඉංග්‍රීසි හමුදාව දෙසට හැරී මෙසේ පැවසීය : ඉංග්‍රීසි හේවායිනි, තොප කිසිවකු බිය විය යුතු නැත. මම වීරෝදාර සිංහලයෙක්මි. නුඹලා ගේ ම වෙඩි උණ්ඩවලින් හා බයිනෙත්තුවලින් පහර දී නුඹලා මරා දැමීමට මට දැන් හොඳට ම ඉඩ කඩ තිබෙනවා. එහෙත් මම එවැනි දෙයක් කරන්නට තරම් බියගුල්ලෙක් නොවෙමි. මගේ සිංහල සහෝදර පිරිස කරන්නේ අපේ ජාතියේ දේශයේ විමුක්තිය පතා සටනක්. මගේ ජාතිය අවදානමට ලක් වී ඇති මේ මොහොතේ එය අමතක කොට තනතුරුවලටත් තාන්නමාන්නවලටත් ගැති වී ක්‍රියා කළොත් මා මගේ ජාතියට ද්‍රෝහියකු වෙනවා ම යි. එසේ වුවහොත් මා මළ පසු මගේ සොහොනටත් හෙණ වදිනු ඒකාන්තයි. එම නිසා නුඹලා මේ වෙඩි බෙහෙතුත් උණ්ඩත් බයිනෙත්තුත් රැගෙන නිරුපද්‍රිතව ආපසු පලයල්ලා'' අප වීරයා විසින් එම පිරිස අත ආණ්ඩුකාරවරයාට එකී විස්තරය ලියූ පහිණ පතක් ද පිටත් කැර යවන ලදී.

## ඌවේ කැරැල්ලේ නායකත්වය

කැප්පෙටිපොළ අදිකාරම්තුමාගේ නියම වීරෝදාර සිංහලකම් ඉස්මතු වී පෙනෙන්නට පටන් ගත්තේ මෙතැන් සිට ය. එතුමා ඌවේ කැරැල්ලේ නායකත්වයට පත් විය. දොරේසාමි, රජු වශයෙන් සිටි අතර තුන් සිංහලයේ ම පළමුවන අදිකාරම් ලෙස අප වීරයා පත් විය. එතුමාගේ එක්වීමෙන් පසු ඌවේ සටනේ නව ප්‍රබෝධයක් ඇති විය.

1818 මුල් අවධියේ ම කන්ද උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන් ගෙන් මුදවා ගෙන සිංහල ආධිපත්‍යය යටතට ගැනීමේ චේතනාවෙන් මෙතැන් සිට සටන මෙහෙයවන ලදී. තමන්ට එරෙහි ව එන සියලුම ඉංග්‍රීසි හමුදා මෙල්ල කරන්නට අප සිංහල පිරිසගේ සමඟි සම්පන්නකමටත් සටන්කාමිත්වයටත් හැකි විය. මේ අවධියේ අප වීරයා සෙබළුන් 6,000 කගේ නායකයා බවට පත් විය.

## උඩරට යුද්ධ නීතිය

1818 පෙබරවාරි 21 වන දින මුළු කන්ද උඩරටම යුද්ධ නීතිය පැනවිණි. මේ වන විට කැප්පෙටිපොළ අධිකාරම්තුමා ඇතළු 18 දෙනෙකුගේ සියලු ඉඩකඩම්, දේපොළ රාජසන්තක වී තිබිණි. එතෙකින් නොනැවතුණු ඉංග්‍රීසි ආණ්ඩුව විසින් එම 18 දෙනාගේ සියලුම වස්තුව තමනට ඔත්තු සපයන සිංහලයන් අතර ම බෙදා දෙනු ලැබිණ.

තත්ත්වය දිනෙන් දින ම දරුණු අතට හැරුණි. අප වීරයාගේ හිස ගෙනැවිත් දෙන අයෙකුට රන් පවුම් 1000 ක් ද මඩුගල්ලේ අදිකාරම්තුමාගේ හිස ගෙනැවිත් දෙන අයෙකුට රන් පවුම් 500 ක් ද පරිත්‍යාග කරන්නට තීරණය කොට ඒ බව පළමුවෙන් ම ප්‍රකාශයට පත් කරන ලද්දේ ද මේ අවධියේ ය.

## පවුල්වලින් පළි ගැනීම

නොනවත්වා ම සටන් ඇවිලෙද්දී වියරු වැටුණු ඉංග්‍රීසි අදිරාජ්‍යවාදීහු අප වීරවරුන්ගේ පවුල්වලින් පලි ගැනීම සඳහා ඉදිරිපත් වන්නට තරම් නිවට වූහ. කැප්පෙටිපොළ අදිකාරම්තුමාට දාව සිටියේ එකම පුත් රුවනකි. එතුමන්ගේ භාර්යාව වූ එතනහාමිත් මැණියනුත් වනයෙහි සැඟවී සිටින බව ඉංග්‍රීසීන්ට දන්වන ලද්දේ අපේ ම හීන දීන කුහක සිංහලයකු විසිනි. ඒ අනුව එම අහිංසක කාන්තාවෝ දෙදෙන අත් අඩංගුවට ගන්නා ලදහ. එම පිරිසට අත්වන්නට ඇති ඉරණම ගැන මෙහි අමුතුවෙන් විස්තර කරන්නට අවශ්‍ය නැත. මේ අයුරින් අප වීරවරයන් 18 දෙනෙකුගේ ම පවුල්වල අහිංසක පිරිස් ඉංග්‍රීසීන් විසින් ජීවිතක්ෂයට පත් කරන ලදී.

## සිංහල ලේ නළියයි

එවැනි ශෝකජනක අවස්ථාවකට අපේ සිංහල ජාතිය පත් වු මොහොතක් ලංකා ඉතිහාසයෙන් ඔබට තවත් සොයා ගත හැකි ද? වර්තමානයේ ජීවත්වන අපි ඒ වීරෝදාර ශ්‍රී නාමයනට කෙසේ නම් උපහාර දක්වා ණය ගෙවමු ද?

සටන් බිම ගිනිදැල් බුර බුරා ඇවිළිණි. 1818 මැයි, ජුනි, ජූලි, අගෝස්තු වනවිට උඩරටින් ඉංග්‍රීසි හමුදා පලවා හරින්නට අපේ වීරයන්ට හැකි විණි.

## ඉංග්‍රීසි හමුදා පසුබසී

1818 ජුනි මාසයෙහි කන්ද උඩරටින් ඉංග්‍රීසි හමුදා වහා ඉවත් කැර ගන්නා අණ ආණ්ඩුකාරවරයා ගෙන් නිකුත් විණි. එම අණ උඌවට යන්නට සතියක් දෙකක් පමා වීම අපේ අවාසනාවකට සිදු වූවකැයි සිතිය හැක.

## සිංහල අසමඟියේ අනිටු විපාක

එම අණ උඅවට යන්නට ප්‍රමාද වූ සුළු කාලය තුළ අපේ ම අය අතර විශාල අරගල හටගන්නට පටන් ගෙන තිබිණි. කුල භේදය, ඊට ප්‍රධාන වශයෙන් මුල් විය. මෙතරම් වීරෝදාර සටනකින් ජය ගන්නට ඔන්න මෙන්න කියා තිබියදී අපේ සිංහල රදළවරුත් සටන්කාමියෝත් ඔවුනොවුන් අතර අසමඟිය වැඩිදියුණු කැර ගත්තේ අපේම අවාසනාවට ය. එවකට ''දොරේසාමි'' නමින් ඔටුණු පැළඳ සිටි තැනැත්තා දුම්බර පළාතේ අඩු කුලයකින් පැවැත එන අයෙකැ යි ප්‍රචාරය වීම මෙම අරගලයට මුල් විය. මඩුගල්ල අදිකාරම්තුමා ඇතුළු පිරිස ඉංග්‍රීසීන්ට විරුද්ධව කරන සටන පසෙක දමා එතැන් සිට දොරේසාමි මරා දැමීමට වෙහෙසුණ හ.

## දොරේසාමි පළා යයි

දොරේසාමි මහියංගනයට පළා ගියේ ය. සිංහල පිරිසකගේ අසමඟිය දවසින් දවස වැඩි විය. කාර්යශූර ඉංග්‍රීසීන්ට මේ බව ඉවෙන් මෙන් අවබෝධ වීය. කන්ද උඩරටින් සේනා ඉවත්කැර ගැනීමට සිතා සිටි ඉංග්‍රීසීහු වහා ම ඒ අදහස අත්හැර දැමූහ. ඔවුහු නැවතත් හීන වෙමින් තුබුණු තම හමුදා බලය තර කරන්නට වූහ.

## ඉන්දියාවෙන් ඉංග්‍රීසි හමුදා

මේ අවධියේ ඉන්දියාවත් යටත් ව තිබුණේ ඉංග්‍රීසීන්ට ය. ඉංග්‍රීසීහු අපට විරුද්ධව සටන් වැදීම පිණිස ඉන්දියාවෙන් සිය හමුදා කැඳවූහ. සිංහලයන් අතර අසමඟිය වැඩි වන්නට ඉංග්‍රීසීන්ගේ ජයග්‍රහණය ද තහවුරු වන්නට විය. සටන්කාමී සිංහල පිරිස් ඉංග්‍රීසීන්ගේ අත් අඩංගුවට පත් වූයේ දහස් ගණනිනි.

## ජාතියේ අවාසනාව ළංවෙයි

තත්ත්වය නරක අතරට හැරෙන බව දැනගත් කැප්පෙටිපොළ අදිකාරම්තුමා, ඇහැලේපොළ අදිකාරම්තුමා හා මඩුගල්ල අදිකාරම්තුමාත් සමඟ නුවර කලාවියට - අනුරාධපුරයට - පැන ගියේ ය. එතුමා සමඟ 5000 ක පමණ පිරිසක් ද පළා ගියහ.

## කැප්පෙටිපොළ අදිකාරම්තුමා ගිලන් වෙයි

අප වීරයා නුවර කලාවියේ දී රෝගාතුර විය. මඩුගල්ල සහ ඇහැලේපොළ යන අදිකාරම්වරු එතුමාට සාත්තු සප්පායම් කළහ. නුවර කලාවියේ ප්‍රදේශ අධිපතිවරයෙකුගේ ආරක්ෂාව යටතේ ඔවුහු පසුවූහ.

## වීරයාගේ හිසට රන් පවුන් 1000 ක්

මේ අවස්ථාවේ කැප්පෙටිපොළ වීරයාගේ හිස ගෙනවිත් දෙන කෙනෙකුට රන් පවුම් 1000 ක් ද මඩුගල්ල අදිකාරම්තුමාගේ හිස ගෙනැවිත් දෙන කෙනෙකුට රන් පවුම් 500 ක් ද දෙන බවට ඉංග්‍රීසි ආණ්ඩුව මඟින් නැවත වරක් ප්‍රසිද්ධ කරන ලදී.

මෙතෙක් යම් තරමක පරාජයක් අත්වූයේ නම් ඊට මූලික හේතුව වූයේ අසමඟිකම බව දැන දැනත් මෙම අවස්ථාවේදී අපේ ඇතැම් සිංහලයන් ක්‍රියා කළේ ඉතා අමනෝඥ විලාසයෙනි. තම ජාතියට වඩා ඔවුන්ට රන් පවුම් ලොකු විය. තණ්හාව නමැති විසෙන් පිරී ඉතිරී ගිය එක්තරා සිංහල මිනිස් සර්පයෙක් අප වීරයා ඇතුළු පිරිසට දඬුවම් කරන්නට මේ හොඳ ම අවස්ථාව යැයි සිතා එතුමා ඇතුළු පිරිස සැඟවී සිටින තැන හොර රහසේ ම ඉංග්‍රීසීන්ට දන්වා යැවී ය.

## ඉංග්‍රීසි හමුදාව ලුහුබැඳ එයි

කැප්පෙටිපොළ අදිකාරම්තුමා අල්ලා ගැනීම සඳහා 1818 ඔක්තෝම්බර් 28 වන දින ලෙෆ්ටිනන්ට් ''විලියම් ඔනිල්'' ගේ ප්‍රධානත්වයෙන් 250 ක පමණ හමුදාවක් අනුරාධපුරයට පැමිණියේ ය. අප වීරයාට එම ආරංචිය සැළවූ මොහොතේ එතුමාගේ කල්‍යාණ මිත්‍ර මඩුගල්ලේ අදිකාරම්තුමා සිටියේ රෝගාතුරව ය. දිවියතත් මිත්‍රයා අතහැර යාමට එතුමා කල්පනා නොකළේ ය. එතුමා සිය මිත්‍රයා අත්හැර දමා පළා ගියේ නැත. සිය මිත්‍රයා ළඟට වී සිදුවන්නට යන විපත ගැන සිතමින් බලා සිටියේ ය.

## ලක්මව වැළපෙයි

ඉංග්‍රීසි හට පිරිස ඉදිරියට එමින් සිටින්නේ ය. කැප්පෙටිපොළ අදිකාරම්තුමා ගිලන්ව සිටින තම කල්‍යාණ මිත්‍රයාගේ දෑත අල්ලාගෙන ඔහුගේ සයනය ළඟ ය. ලක්මව තව මොහොතකින් සිදුවන්නට යන විපත දැක ශෝකයෙන් වැළපෙන්නී ය. ගතවූයේ නිමේෂයකි. ලෙෆ්ටිනන්ට් විලියම් ඔනිල් ප්‍රධාන පිරිස අප වීරයා වටකැර ගත්හ. ''මම තමා කැප්පෙටිපොළ'' යනුවෙන් පවසමින් පෙරට ගිය එතුමා ඉංග්‍රීසීනට භාරවිය. රෝගී වූ අවස්ථාවේ තමා අත් නොහැර සෙවනැල්ලක් මෙන් ළඟ සිටි සිය කල්‍යාණ මිත්‍රයා ඉංග්‍රීසීන්ට යටත් වනු දැක මඩුගල්ලේ අදිකාරම්තුමාට ඇති වූ වේදනාව කොතෙක් වන්නට ඇද්දැයි අපට සිතා ගන්නට වත් බැරි තරම් ය. මෙම අවාසනාවන්ත සිද්ධිය වූයේ පරවහගම නම් ග්‍රාමයේ දී ය. කුහක නින්දිත ජාතිද්‍රෝහී සිංහලයකුගේ අදූරදර්ශී ක්‍රියාව නිසා අහෝ ජාතික වීරයකුට වූ විපත.

අප වීරයාට සම්බන්ධ නඩු විභාගයේ දී කතරගම, මහබෙත්මේ නැමැත්තා මෙසේ ප්‍රකාශ කැර ඇත. ''කැරළිකාරයෝ තමා හිර බාරයට ගත් බව අඟවන්නට කැමති උණාට මොකද කැප්පෙටිපොළ ඔවුන්ට අහුවුණේ සිය කැමැත්තෙන්ම යි. කැරළිකාරයෝ අලුපොත පැත්තේ ඉන්න බව කැප්පෙටිපොළ දැන ගත්තා. ඒ උනත් තමාගේ ආරක්ෂාවට කිසිම අවි ආයුධයක් නැතුව. තමන්ගේ පිරිසටත් අවිආවුද සපයා නොදී, ඔහු කැරළිකාරයෝ ඉන්න පැත්තට අශ්වයා පිටින් ගියා. කැරළිකාරයෝ එළියට ඇවිදින් කැප්පෙටිපොළ වට කර ගත්තා ''මේ මොකද?'' ඔහු ඇසුවා. කොටඹේ රාළ ඉස්සරහට ඇවිත් මෙහෙම කීවා : ''අපේ රට මෙතෙක් කල් අඳුරේ තිබුණා. නමුත් දැන් සියළු දෙනා මත එකාකාරව බබළමින් එළිය විහිදන සූර්ය දිව්‍ය රාජයාට සමාන රජ කෙනෙක් පහළ වී ඉන්නවා. එතුමා කෙරේ විශ්වාසයක් ඇත්නම් අපට එකතු වෙන්න. නැත්නම් ඔබ මෙතනදී ම මරා දාලා ඔබේ හිස රජතුමා ළඟට අරන් යනවා...'' ඕනෑනම් මොහුට කැරලි කාරයන්ගෙන් බේරී යාමට ඉඩ තිබුණා. ඔහුට සෑහෙන ලොකු පිරිසක් සිටියා. කැරළිකාරයන්ගේ ගණන 250 ක් විතර, කැප්පෙටිපොළ ගේ පිරිස 5000 ක් විතර සිටියා.

එතුමාට පළා යන්නට වුවමනාව තුබුණේ නම් එසේ කරන්නට හොඳට ම ඉඩකඩ තිබුණු බව මෙම සාක්ෂියෙන් මනාව පැහැදිලි වේ.

## නඩුව ඇසෙයි

එතුමාට විරුද්ධ නඩුව මහනුවර ඉංග්‍රීසි මහාධිකරණයේ දී ඇසුනේ 1818 නොවැම්බර් 1 වන දා ය. ''නීතිප්‍රකාර අන්දමින් එංගලන්ත මහ රජතුමා විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි රාජ්‍යයට විරුද්ධව කුමන්ත්‍රණය කිරීම'' එතුමාට විරුද්ධව තිබූ

බරපතල ම චෝදනාව ය. එම චෝදනාවට වැරදිකරු බව ඔප්පු වූයෙන් 1818 නොවැම්බර් 26 වන දා බෝගම්බර වධක භූමියේ දී හිස ගසා මරා දමන්නට නියම විය. මඩුගල්ල අදිකාරම්තුමා ද එලෙසින් එදින ම මරා දමන්නට නියම විය.

## අභය දානය ඉල්ලා සිටීම

උඩරට ප්‍රදේශවල රෙසිදන්ත ධූරය දැරූ ජෝන් ඩොයිල් හා කර්නල් යන අය මේ දෙදෙනාට අභය දානය දෙන ලෙස ඉල්ලා සිටි නමුත් එම ඉල්ලීම නිශ්ප්‍රභ විය. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ තීරණය වෙනස් කරන්නට එම ඉල්ලීම්වලට ශක්තිය මදි විය. 1818 නොවැම්බර් 16 වනදා වන විට මේ පිරිසට විරුද්ධ නඩු අසා නිම වී තිබිණි. එදින සිට දින 10 ක් (නොවැම්බර් 26 වන දා වනතුරු) එතුමන්ලා විශේෂ ආරක්ෂා සංවිධාන මැද සිරකර සිටියේ බෝගම්බර සිර ගෙදර ය. (එම නඩුවේ තීන්දුව ලැබුණේ නොවැම්බර් 21 වන දා ය. 26 වන දා පෙරවරු 8 ට හිස ගසා දමා එතුමා මරණයට පත් කරන බව ප්‍රකාශයට පත් කළේ 24 වන දාය )

## හෙන්රි මාෂල්

හෙන්රි මාෂල් නමැති යුද හමුදා ආරෝග්‍යශාලාව නියෝජ්‍ය ඉන්ස්පෙක්ටර් ජනරාල්වරයා අප වීරයාගේ සුවදුක් බැලීමට නිතර නිතර සිර ගෙදරට ගියේ ය. එම දෙපොළ කලින් සිට ම මිත්‍ර ව සිටි හෙයින් සුහද සාකච්ඡාවලට ඒ හමුවීමෙන් මඟ පෑදුණි. එතුමා අප වීරයා සමඟ එදිනෙදා කරුණු ගැන පවා සාකච්ඡා කැර ඇත. තමන් කළ සටන් පිළිබඳ ව අප වීරයා ශ්‍රේෂ්ඨ ලීලාවෙන් ප්‍රකාශ කළ අදහස් එතුමා විසින් ලියන ලද ලිපිවල සඳහන් වෙයි. අප වීරයා සිර ගෙදරට භාර වන්නට කලින් ඉතා පිරිසිදුවට ඇඳුම් ඇන්ද බව මාෂල් තුමා පවසයි.

එක් අවස්ථාවක තමා හැඳ සිටි කිලිටි ඇඳුම් පෙන්වා ''මා කලින් ඇන්දේ මෙසේ නොවන බව ඔබ දන්නවා නොවැ'' යනුවෙන් ද පවසා ඇත. මේ විපත ඔබට සිදුවීමට ප්‍රධාන හේතුව කුමක් ද කියා ඔබ සිතන්නෙහි දැ යි ඇසූ ප්‍රශ්නයට අප වීරයා දී ඇති පිළිතුර මෙසේ ය. ''මේ සිදුවීමට හේතු මෙලොවදී ම මා කළ දෙයක් නොවෙයි පෙර ජාතියක මවිසින් කරන ලද කර්ම විපාකයකි. ඒ පාප කර්මය නිසා නොවේ නම් ම විසින් කරන ලද සේවයට ලැබෙන්නේ මෙබඳු දඬුවමක් නො වේ. උදාර සේවයක් කළ ජාතික වීරවරයෙකුට හිමිවන ගෞරවයයි. ''කැරැල්ල සාර්ථක වීනම් රාජද්‍රෝහියකු වශයෙන් හංවඩු ගසා අපකීර්තියට භාජනය කරනු ලබනු වෙනුවට දේශප්‍රේමියකු වශයෙන් සම්භාව්‍යතාවට ද සම්මාන්‍යතාවට ද කැප්පෙටිපොළ පත් වෙනු ඇතැයි පසුව මාෂල් මහතා ද පවසා ඇත.

## 1818 නොවැම්බර් 26

1818 නොවැම්බර් 26 වන දා සිරිලක් මව සෝ කඳුළු වැගුරූ දවසකි. දැඩි රැකවරණ යටතේ අප වීරයාගේ හිස ගසා දැමීම සඳහා බෝගම්බර වධකස්ථානය කරා කැඳවාගෙන එමින් සිටියදී දළදා වහන්සේ අන්තිම වරට වැඳ පුදා ගැනීමට ඉංග්‍රීසීන්ගෙන් අවසර ඉල්ලා ඇත. ඒ සඳහා අවසර ලැබුණෙන් එතුමා දළදා වහන්සේ වැඳ පුදා ගැනීම සඳහා දළදා මාලිගාවට සැපත් විය.

## බුදුගුණ කියයි

එතුමා දළදා සමිඳුන් ඉදිරියේ ශබ්ද නගා ''බුදු ගුණ'' ගායනා කැර ඇත. අවසානයේ එතුමා මෙම ප්‍රාර්ථනය ද කැර ඇත.

''ඉතො චුතෝහං වර ජම්බු දීපෙ
හිමාලයෙ හෙමමයම්හි කූටෙ

කප්පායුකො දෙවපතීව හුත්වා
මෙත්තෙයා නාථස්ස සුණාමි ධම්මං''

''හිමාලය වනයෙහි දෙවියෙකු ව ඉපදී මෛත්‍රී බුදුරදුන්ගේ කාලයෙහිදී උන් වහන්සේ ගෙන් ධර්මය ශ්‍රවණය කැර නිවන් දකිම්වා යනු එහි සංක්ෂිප්ත අදහසයි.

එතුමා ඉදිරි භවයන්හි දී සිංහලයෙකු ව උපදින්නට පැතුවේ නැත. මෙතරම් සේවයක් රට-ජාතිය-ආගම වෙනුවෙන් කළ තමා, රන් පවුම් ලබා ගැනීම සඳහා ඉංග්‍රීසීන්ට අල්වා දෙන්නට තරම් දෝහී වූ සිංහලයන් අතර, නැවතත් උපදින්නේ කුමට දැයි එතුමාට සිතෙන්නට ඇත. එතුමා තමා හැඳ සිටි කිළිටි වූ තුප්පොට්ටිය (නිලමේවරුන්ගේ ඇඳුම) ගලවා හොඳට නමා දළදා සමිඳුන් අභියසට ගෙන ගොස් මෙසේ ප්‍රකාශ කැර එය දළදා සමිඳුන්ට පූජා කෙළේ ය.

''දළදා හාමුදුරුවනේ, මගේ මේ ජීවිතයට කරන්න පුළුවන් අන්තිම පූජාවයි මේක. මේක කිළිටි වූවත් මා කෙරේ අනුකම්පාවෙන් පිළිගන්න''

අවසාන ධර්ම දේශනය පැවැත් වූ ස්වාමීන් වහන්සේ, ''ඔබ කර ඇති පින්වල බලයෙන් ඔබට නිවන් දකින්නට හැකිවෙනවා ඒකාන්ත'' යි පවසා ඇත.

අප වීරයා සමඟ හිස ගසා දමන ලද අනෙක් වීරයා නම් මඩුගල්ලේ අදිකාරම්තුමා ය. තමා සමඟ අවසන් වශයෙන්

කතා කිරීමේ අදහසින් දළදා මැඳුරට පැමිණි සයිමන් සෝයර්ස් නමැති බදුල්ලේ ඒජන්තවරයා ඇමතූ අප වීරයා ''ඒජන්තතුමනි, මාත් සමඟ වධක භූමියට යන්නට එන්න. ඔබට ලොකු තෑග්ගක් දෙන්නට තියෙනවා'' යනුවෙන් පැවසී ය. එහෙත් තමා සමඟ ඉතා හිතවත් ව සිටි අදිකාරම්තුමාට අත්වන ඉරණම සියැසින් දැක ගැනීම සඳහා පැමිණෙන්නට ඔහු කැමති වූයේ නැත.

## මඩුගල්ලේ ඔය පිස්සු ක්‍රියාව නවත්වන්න

මේ වේලාවේදී මඩුගල්ල අදිකාරම්තුමා මරණ බියේ හඬන්නට විය. ඔහු ඇමතූ කැප්පෙටිපොළ අදිකාරම්තුමා ''මඩුගල්ලේ, ඔය පිස්සු ක්‍රියාව නවත්වලා එඩිතර ව සිංහලයාගේ අදීනකමත් ප්‍රෞඪත්වයත් පෙන්වා මරණයට පත් වන්න'' යනුවෙන් අවවාද කෙළේ ය. ඊට කලින් දළදා සමිඳුන් වැඳ ගන්නට ගිය අවස්ථාවේ සැඟවෙන්නට උත්සාහ දරද්දී ද එතුමා මඩුගල්ලේ අදිකාරම්තුමාට එසේ ම අවවාද කැර ඇත.

## අවසන් ගමන

තම මුව සහ දෑත් සෝදාගත් එතුමා හිසකේ කොණ්ඩයක් කොට හිස මුදුනට තබා බැඳගත්තේ ය. සිය මහපටැඟිලි තුඩින් පඳුරක් දැඩි සේ තදකර අල්වා ගනිමින් හිඳගත්තේ ය. පසුව අසල සිටි සිංහල හේවායකුට කථා කොට, තම ඉනෙහි සඟවා ගෙන තිබූ තල්පත් ඉරුවල ලියූ ''ධම්මපදය'' ග්‍රන්ථයක් එළියට ගෙන එය ඔහුට භාර දෙමින් මෙසේ කී ය.

''පුත, මේ තල්පත්වල ලියා ඇති ''ධම්මපද '' ග්‍රන්ථය මගේ හිත මිත්‍ර සයිමන් සෝයර්ස් ඒජන්ත තුමාට භාර දෙන්න.

දැන් එතුමා මරණයට සූදානම් ය. එතුමා වධකයාට කථා කොට ''මම ඉතිපි සො... ගාථාව කියන අතරේ නුඹ මගේ හිස එක කඩු පහරින් වෙන් කරන්න ඕනෑ'' යැයි කී ය.

''ඉති 'පි සො භගවා අරහං...''

කඩුපහර එතුමන්ගේ ගෙල හරහා වැදිණි. ඉතා ශක්ති සම්පන්න එතුමාගේ හිස එක පහරින් වෙන් කරන්නට වධකයා අසමත් විය. ගෙළ දෙපසින් උණු ලේ වැගිරිණි. එහෙත් කැප්පෙටිපොළ අදිකාරම්තුමා කථා කළේ ය. ''වධකය, නුඹ මා කී දේ හරියට කළේ නැහැ නොවැ? මෙන්න මෙතනට තව පහරක් ගසන්න'' යි එතුමා කඩුපහර ගැසිය යුතු තැන ද පෙන්වීය. වධකයා එපරිද්දෙන් ක්‍රියා කෙළේ ය. ජාතිය වෙනුවෙන් සටන් කළ වීර කැප්පෙටිපොළ අදිකාරම්තුමා හිස කඳින් වෙන් වී බිම පතිත විය. ලක්මවගේ හදවතෙහි ගැස්ම වැඩි වූයේ ය. ඒ සමඟ ඉතිහාසයෙහි තවත් ශ්‍රේෂ්ඨ නමක් සදා නොමැකෙන සේ රන් අකුරින් ලියැවුණේ ය.

මෙතරම් වීර සිංහලයකුගේ හිස පොළොවට පස් වන්නට ඉඩදීම සුදුසු නැතැයි සිතූ හෙන්රි මාෂල් තුමා එය පරීක්ෂා කිරීම සඳහා එංගලන්තයට යැවී ය. එය පරීක්ෂා කළ සත්ත්ව විශේෂඥයකු වූ දොස්තර ''හිල්'' මහතා ඉදිරිපත් කරන ලද වාර්තාවේ තොරතුරු අනුව කැප්පෙටිපොළ අදිකාරම්තුමා අපූර්ව ගණයේ නියම සිංහලයෙකැයි නිගමනය කළ හැක. අයුක්තිය ඉදිරියෙහි නොනැමූ, එහෙත් යුක්තිය ඉදිරියෙහි නැමූ එතුමාගේ උත්තරීතර හිස 1954 වනතුරු ඉංග්‍රීසීන් විසින් ආරක්ෂා කරන ලදී. නිදහසින් පසු ලංකාවට නැවත එය ලැබිණි. එය 1954 නොවැම්බර් 26 වන දා මහනුවර දළඳා මැදුර අභියස ඇති මහ මළුවේ පිහිටුවා තිබෙන වාරියපොළ සුමංගල හිමියන්ගේ ප්‍රතිමාවට පිටුපසින් මහා ස්තම්භයක් තනවා එහි නිදන් කරන ලදී.

එතුමා වෙනුවෙන් අපට කළ හැකි උදාර ම සේවය නම් ධනයට, කුලයට, බලයට හෝ තාන්නමාන්නවලට ගැතිකම් නොකොට සමඟියෙන් බැඳී කළ ගුණ සලකන ජාතියක් වශයෙන් නැඟී සිටින්නට ක්‍රියා කිරීම ය.

**වැඩිදුර කරුණු දැන ගැනීම සඳහා මේ පොත් කියවන්න :**

- දළදා ඉතිහාසය සහ සංස්කෘතිය
  කඹුරුගමුවේ වජිර හිමි

- උඩරට මහ කැරැල්ල, 1818
  තෙන්නකෝන් විමලානන්ද

- කැප්පෙටිපොළ දිසාව
  රජයේ ප්‍රකාශනය

- ත්‍රිසිංහලයේ නායකයෝ
  නුවරඑළියේ හේමපාල

- උඩරට රාජධානිය
  අබයසිංහ, දේවරාජ, සෝමරත්න

- සිංහල වීරයෝ
  ටී. එස්. ධර්මබන්දු

# දැයට ලියූ කවි

හේද සුළං සැඩ ජාතික ආලෙහි රැක්මුල මුත් සොල වන්නා
හාද කමක් අඟවා ම විදේසිකයා ගිනි දූන මොළ වන්නා
පාද වමින් නැණ මීට වහා පිළියම් නොකළොත් අප කාටත්
වේද කුමක්? විමසව් අද සිහලුනේ නොනිදා මර නින්දේ

සාදු සිරිත් සිය දේසෙ ඇතත් කැත වානරයන්ගෙ විලාසෙන්
මූදු තෙරින් එන නීච භයංකර සංකර වූ හැම දේවල්
සාදු නදින් පිළිගත්තු නිසා වුණු ජාතික හානිය අයියෝ
මීදු මකින් කඳු සේ අප ආරිය සෑම සිරිත් යටපත් වී

ජීවිතයේ වටිනාකම නම් තම ජාතික මුක්තිය වේ මැ යි
පේව් නමුත් සැහැසි ව නමුත් වහසී ව නමුත් මට කම් නෑ
මා විසිනී කළයුත්ත කරන්නට වන්නෙමි ඇයි ද පමාවක්
මේ විලසින් නොතකයි ද යමෙක් ඔහු ලක් මවගේ සතුරා වේ

තුම් නිදහස් රැකෙහි සෙවනැල්ලෙහි සිංහලයෝ සැතපෙත්වා
ගම් බිර දම් සහ පෙම් සමගී රස කා අතරත් පැතිරේවා
හිම් කොට සිවු සයුරක සුනෙරත් රුදු දෑ කුල බේ දුරුවේවා
පෙම්බර ලක් මව සව් සැපතින් වැජඹේ වැජඹේ වැජඹේ වා

''ලංකා මාතා''
ටිබෙට් ජාතික
එස්. මහින්ද හිමි

## කැප්පෙටිපොළ සමරුව

ජාතිය පාවා නුදුන් පිනෙන්
ඔබ මතු නිවන් දකීවී
හෙළයේ හෙළ පවුලක ඉපදී
ඔබ මතු නිවන් දකීවී .

ඔබගේ ගෙල සිඳ
හෙළූ ලෙයින්
පණ ලැබුවෝ
සිංහල දරුවෝ
ඒ රුධිරය මත
පිපුණු මලින්
ඔබ පිදුවෝ
සිංහල දරුවෝ

වෙල්ලස්සේ මහ
සටන් බිමේ
දිවි දුන්නෝ
ජාතිය නැගුවෝ
ඒ ඔබලා වැනි
නර විරුවන්
සිහි කෙරුවෝ
සිංහල දරුවෝ

රඹුකන සිද්ධාර්ථ හිමි



කවර නිර්මාණය සහ සිතුවම් සුසිල් ජයශාන්ත පෙරේරා
ISBN-978-955-8048-27-6